# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்
## DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ. இல. 419, இல. 330, யூனியன் பிளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: ස.සං.දෙ./බැංකු/02/04/09

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2022.05.18

**නියාමන උපදෙස්-බැ/නි/ඒ/2022/02**

සියලුම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් වෙත,

**සමුපකාර මූල්‍ය සේවා සමිති සඳහා තැන්පතු සහ ණය පොළී අනුපාත තීරණයන් පිළිබඳ උපදෙස් සහ මඟපෙන්වීම්**

**01.** හැඳින්වීම

- මෙම උපදෙස් සහ මඟපෙන්වීම් නිකුත් කිරීමේ අරමුණ වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති මඟපෙන්වීම් සහ උපදෙස් අනුව වර්තමානයේදී ක්‍රියාත්මක වන දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථරයන් යටතේ මූල්‍ය සේවා සමුපකාර සමිති විසින් තම සාමාජික සහ සාමාජික නොවන තැන්පතු පොළී අනුපාත සහ ණය පොළී අනුපාත සංශෝධනයන් පිළිබඳව ඉදිරි මඟපෙන්වීම් සිදු කිරීම වේ.
- දිවයිනේ වෙළෙඳපොල පොළී අනුපාත සහ මහ බැංකු ප්‍රතිපත්තිමය පොළී අනුපාතයන්ගේ වෙනස්වීම් පිළිබඳව නිශ්චිතව පුරෝකථනය කිරීම අපහසු හෙයින් මෙම උපදෙස් සහ මඟපෙන්වීම් මඟින් ද නිශ්චිතව සහ සංඛ්‍යාත්මකව පොළී අනුපාත පිළිබඳ වෙනස් වීම් හඳුන්වා දීම ප්‍රවර්තන සාර්ව ආර්ථික තත්ත්වයන් යටතේ ප්‍රායෝගික නොවන හෙයින් එක් එක් මූල්‍ය සේවා සමිතිවල කළමනාකාරීත්වයට එම තීරණයන් ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය කරන මඟ පෙන්වීම් පමණක් මෙම උපදෙස් සහ මඟපෙන්වීම් මඟින් හඳුන්වාදීමට අපේක්ෂිතය.

**02.** තැන්පතු පොළී අනුපාත

- රාජ්‍ය බැංකු,පෞද්ගලික බැංකු සහ මූල්‍ය සමාගම් අතිශයින් තරඟකාරී ලෙස තම ගණුදෙනුකරුවන් රඳවා ගැනීමට සහ නව තැන්පතු රාශිකරණය සඳහා අධික පොළී අනුපාත ඉදිරිපත් කරමින් ඒ සඳහා ප්‍රචාරයන්ද සිදු කරන මෙම අවස්ථාවේ දී සමුපකාර මූල්‍ය සේවා

සමිති තම ප්‍රවර්තන තැන්පතු රඳවා ගැනීමට සහ තම සාමාජිකයන් තරඟකාරී ආයතන වලට ප්‍රවේශ වීම වලක්වා ගැනීම පිණිස උපක්‍රමික ක්‍රියාමාර්ගයන් නොපමාව හඳුන්වා දිය යුතු ය.

- තම තැන්පත්කරුවෙකු මුදල් ආපසු ලබා ගැනීමට කවුන්ටරයට පැමිණි අවස්ථා වල දී ඔවුන් සමඟ සුහද ලෙස සාකච්ඡා කර තරඟකාරී ආයතනයකට එම තැන්පතු ගලා යෑම වලක්වා ගැනීම සඳහා සමිතිවල බැංකු සේවා ප්‍රධානීන් සහ අනෙකුත් කාර්යමණ්ඩලය කටයුතු කල යුතු ය. අවශ්‍ය අවස්ථා වලදී විශාල ප්‍රමාණයේ තැන්පතු ආපසු ගැනීම වලක්වා ගැනීම පිණිස විශේෂ පොළී ප්‍රතිශතයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ලබා දීමට හැකි අතර, එසේ ලබාදීමට හේතු සහ ගණුදෙනුකරුගෙන් ආයතනයට සිදුවන ලාභදායීත්වය පිළිබඳව අවධානය යොමු කරමින් තීරණයන්ට එළඹිය යුතු ය.
- තැන්පතු පොළී අනුපාත සංශෝධනය කරන්නේ නම් රාජ්‍ය බැංකු විසින් දැනට ගෙවනු ලබන පොළී අනුපාතයට සමානව හෝ එයට සුළු වශයෙන් ප්‍රතිශතයක් එකතු කිරිම කල හැක.

## 03. ණය සඳහා පොළී අනුපාත

- තැන්පතු පොළී අනුපාත වැඩිවීමේ ප්‍රවණතාව හමුවේ අනිවාර්යයෙන්ම ණය පොළී අනුපාතද වැඩි විය යුතු ය. ප්‍රවර්තන ණයකරුවන් සඳහා පොළී අනුපාත වෙනස් නොකල යුතු අතර නව ණය අයදුම්කරුවන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් මත පොළී අනුපාත සංශෝධනය කල හැක.
- ප්‍රවර්තන අධි උද්ධමනකාරී තත්ත්වය හමුවේ අත්‍යවශ්‍ය නොවන දෑ සඳහා වන පාර්භෝගික ඉල්ලුම සීමා කිරීම සඳහා සහ භාණ්ඩ සහ සේවා සැපයුම වැඩි කිරීමට හේතු නොවන ණය සම්පාදනයන් අවම කිරීම සඳහා පොළී අනුපාත සංශෝධනයන් සිදුකිරීම කෙරෙහි මූල්‍ය සේවා සමිති වල අවධානය යොමු කල යුතු ය.
- කෘෂි කර්මාන්තය, වැවිලි කර්මාන්තය, ධීවර නිෂ්පාදන, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, කිරි නිෂ්පාදනය ඇතුලු සත්ව පාලන ව්‍යාපෘති, ආහාර නිෂ්පාදනය, ස්වයං රැකියා වැනි ජාතික නිෂ්පාදනයට සහ රැකියා නියුක්තිය කෙරෙහි දායකත්වය සපයන ව්‍යාපෘති සඳහා මූල්‍යකරණය කිරීමේදී ඒවා සඳහා අවස්ථාවන් සැලසීම පිණිස අවම පොළී අනුපාත සලකා බැලිය යුතු ය. තවද ව්‍යාපෘතිකරුවන් විසින් තම අරමුදල් සඳහා දරණ පිරිවැය වැඩිවීම තුලින් භාණ්ඩ සහ සේවා වල මිල තවදුරටත් වැඩිවීමට තුඩුදෙන හෙයින් නිෂ්පාදන යොමුගත අවශ්‍යතා කෙරෙහි සම්පාදනය කරන ණය මුදල් සඳහා හැකිතරම් අඩු පොළී අනුපාතයන් ලබාදෙන අතරතුර එම අවශ්‍යතාවන්ගේ සත්‍යතාව පූර්ව සහ පසු පරීක්ෂණ වලින් තහවුරු කර ගනිමින් අඩු පොළී අනුපාත ප්‍රතිලාභයන් අවභාවිතා කිරීම වලක්වා ගැනීමට කටයුතු කල යුතු ය.

**04. පොදු කරුණු**

පොළී අනුපාත සංශෝධනය කිරීම සමුපකාර සමිතියේ වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (Assets and Liability Management Committee- ALCO) විසින් තීරණය කල යුතු අතර සමිතියේ සාමාන්‍යාධිකාරී, බැංකු සේවා ප්‍රධානී, මූල්‍ය ප්‍රධානී කමිටුව සහභාගීත්වය දැක්විය යුතු අතර, සියලුම ග්‍රාමීය බැංකු කළමනාකරුවන් එක් එක් ග්‍රාමීය බැංකුවට අදාල තැන්පතු සහ ණය සම්බන්ධ නිවැරදි දත්ත සහ තොරතුරු ඉදිරිපත් කරමින් කමිටුවට සහය දැක්විය යුතු ය.

ඔබ පළාතේ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම්වලට මෙම නියාමන උපදෙස් නිකුත් කර, ඊට අනුගත වීමට අවශ්‍ය පරිදි නියාමනය කිරීමට කටයුතු යොදන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

Gamani

ගමානි එන්. ලියනාරච්චි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්